ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2239/25 - 2021 අගෝස්තු මස 03 වැනි අඟහරුවාදා - 2021.08.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**9 වන සංශෝධනය**

ශ්‍රී ලංකා හෙද සේවයේ සේවා ව්‍යවස්ථාව

පහත I කොටසේ සඳහන් පරිදි සංශෝධිත 2013 නොවැම්බර් 19 දිනැති අංක 1837/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසේ දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලබන අතර මෙම සංශෝධිත විධිවිධානයන් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණය ගනු ලැබූ 2021 ජූලි මස 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

**වෛද්‍ය එස්. එච්. මුණසිංහ,**
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2021 අගෝස්තු මස 03 වැනි දින.

**1 කොටස**

සංශෝධන අංක 1 - 2014 සැප්තැම්බර් 23 දිනැති අංක 1881/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 2 - 2016 මැයි 11 දිනැති අංක 1966/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 3 - 2016 සැප්තැම්බර් 27 දිනැති අංක 1986/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 4 - 2017 ජූනි 07 දිනැති අංක 2022/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 5 - 2018 අගෝස්තු 27 දිනැති අංක 2086/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 6 - 2018 සැප්තැම්බර් 07 දිනැති අංක 2087/75 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 7 - 2020 පෙබරවාරි 25 දිනැති අංක 2164/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 8 - 2021 ජූලි 30 දිනැති අංක 2238/33 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*

1A - G 34760 — 21 (2021/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

11 කොටස

**10. ශ්‍රේණි උසස් කිරීම**

**10.1 III වන ශ්‍රේණියේ සිට II වැනි ශ්‍රේණියට උසස් කිරීම**

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් -

(i) සේවයේ III වැනි ශ්‍රේණියේ පත්වීම් ස්ථිර කර තිබීම.(තනතුරෙහි ස්ථිර කිරීමේ ලිපියක් නිකුත් කර තිබිය යුතු වේ.)

(ii) සේවා ගණයේ III ශ්‍රේණියේ වසර පහක (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාල කාලයට නියමිත වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන තිබීම.

(iii) අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ පූර්වාසන්න වසර පහ (05)ක් තුළ සතුටුදායක හෝ එයට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

(v) අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

(vi) උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**10.2 II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම**

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

(i) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පෙර සේවයේ II ශ්‍රේණියේ වසර හතක (07) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ කාලයට නියමිත වැටුප් වර්ධක හතක් (07) උපයාගෙන තිබීම.

(ii) අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ පූර්වාසන්න වසර හතක් (07) ක් තුළ සතුටුදායක හෝ එයට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iii) දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

(iv) උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහ තුළ (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

08 - 203

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.